## කෝරළේ පත්තු - උතුර ප්‍රාදේශිය සභව

## මඩකලපුව දිස්ත්‍රික්කය

------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ
------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 02 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට කෝරළේ පත්තු - උතුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම
---------------------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එල්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 13,000 ක්වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) කඩ කාමර අළුත්වැඩියා, විදුලි වැඩ, පරිගණක අළුත්වැඩියා වියදම් වල එකතුව රු. 261,282 ක මුදල මූලධන වියදම් යටතේ ගිණුම්වල පෙන්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්
-------------------

සේවය අත්හැර ගිය දෙදෙනෙකුගේ ණය ශේෂය වන රු. 226,977 ක මුදල අයකර ගැනීම සඳහා 2011 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 81,772,447 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 243,500 | ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු | 574,145 | |
| පුස්තකාල පොත් | 390,917 | |
| පරිගණක | 210,244 | |
| ඡායාරූප උපකරණ | 24,500 | |

1.3.5 නීති, රීති හා රෙගුලාසි සනාදියට අනුකුල නොවීම

-----------------------------------------------------

පහන සඳහන් අනුකුල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 (1) වගන්තිය | ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබන නිශ්චල වත්කම් හදුනාගෙන එම වත්කම්වල වාර්ෂික වටිනාකම් තක්සේරු කර වරිපනම් බදු අය කර ගැනීමට කටයුතුකර තොතිබුණි. |
| (ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) 1පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට ක්‍රමානුකූලව භාරදී තිබුණද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයේදී ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයට අදාල තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ විස්තර අයවැය ලේඛනය සමඟ සංසන්දනයකර විචලනය සඳහා පැහැදිලි කිරීම් ඇතුලත් වාර්තාවක් පිළියෙලකර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.5,419,091 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.3,303,054 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,116,037 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 625,000 | - | 625,000 |
| බදු කුලී | 800,000 | 240,818 | 559,182 |
| සේවා ගාස්තු | 285,000 | 63,724 | 221,276 |
| රාජ්‍ය බදු ආදායම් | 7,441,261 | 5,177,816 | 2,263,445 |

#### 2.2.2 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි සඳහා වරිපනම් බදු අයකර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්ෂික වටිනාකම තක්සේරු කිරීම සඳහා කටයුතු නොකිරීම නිසා දල වශයෙන් රු. 500,000 වාර්ෂික ආදායමක් අහිමිවී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආලංකුලම්, මරුදන්කේනි ගම්මානයේ JICA ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මකවූ ජල බෙදාහැරීමේ කටයුතු සඳහා ඉන්දන වියදම වශයෙන් රු. 269,500 ක් සභා අරමුදලින් වැයකර ඇත. මෙම වියදම JICA ව්‍යාපත්තියෙන් ප්‍රතිපූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලින් සභාව වෙත ලබාදී තිබූ වාහන 15 ක වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගැනීම සඳහා වසර දහයක සිට කටයුතු කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-----------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියේ සඳහන් පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 12 % සිට 60 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම් කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය